**ශීර්ෂය - 203 - ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 අප්‍රේල් 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දිමේ නිලධාරි වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 අප්‍රේල් 29 දින නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

## 2.1 අග්‍රිම කළමනාකරණය

------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙනත් ආයතන විසින්, වාර්තා කරන ආයතනය වෙනුවෙන් දරන ලද රු.43,932,466 ක් වූ වියදම් ශේෂය මුළු වියදම සමඟ ගැළපීමට පෙර ශේෂ පිරික්සුම පිළියෙල කිරීම හේතුවෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා ශේෂ පිරික්සුම අතර එම ප්‍රමාණයෙන් වෙනසක් නිරීක්ෂණය විය. | සංවර්ධන කාර්යයන් හා විවිධ පරිපාලන වියදම් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට ප්‍රතිපාදන මාරු කිරීම් හා ලැබීම් කළ පසු එම ආයතන වල වියදම් වල වටිනාකම ශේෂ පිරික්සුමේ සඳහන් වියදම හා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව ශුද්ධ වියදම අතර ඇති වෙනස වශයෙන් රු44,053,417.ක් හඳුනා ගෙන ඇත. | වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතු බව. |

## 2.2 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදි දෙපාර්තමේන්තුව විසින් පුනරාවර්තන වැය විෂයයන් 03 ක් හා ප්‍රාග්ධන වැය විෂයයක් සඳහා සපයා ගෙන තිබුණු රු.31,697,250 ක් වු මුළු ශුද්ධ ප්‍රතිපාදනයම 2021 අගෝස්තු මාසය වන විටත් වියදම් නොකර ඉතිරි කර තිබීම හේතුවෙන් 2021 අගෝස්තු 28 දිනැති රාජ්‍ය වියදම් සමාලෝචනය පිළිබඳ අමාත්‍ය මණ්ඩල සංදේශය පරිදි අවුරා තැබීමට සිදුවී තිබුණි. | විදේශ සංචාර අත්හිටුවීම, ගිණුම්කරන දෝශ, බැඳීම් ඇතිකර නොගත් ව්‍යාපෘති අත්හිටුවීම, ප්‍රතිපාදන අවුරා තැබීම ආදි කරුණු හේතුවෙන් මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවීම. | වෙන්කර ගනු ලැබු ප්‍රතිපාදන අදාල කාර්යයට යොදවා ගත යුතු බව. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදි දෙපාර්තමේන්තුව විසින් පුනරාවර්තන වැය විෂයයන් 07 ක් හා ප්‍රාග්ධන වැය විෂයයන් 03 ක් සඳහා අවශ්‍ය රු.46,097,680 ක් වු මුළු ප්‍රතිපාදනයම සපයාගෙන තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය වනවිට මුළු ප්‍රතිපාදනයෙන් රු.14,021,916 ක් හෙවත් සියයට 16 සිට සියයට 58 දක්වා වු පරාසයකට අයත් ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. | ඉදිරියේදී වෙන්කරගනු ලබන ප්‍රතිපාදන අදාල කාර්යයට යොදවා ගැනීමට කටයුතු කරන බව. | වෙන්කර ගනු ලැබු ප්‍රතිපාදන අදාල කාර්යයට යොදවා ගත යුතු බව. |
| (ඇ) | පුනරාවර්ථන වැය විෂයයන් 03 ක් හා ප්‍රාග්ධන වැය විෂයයක් සඳහා සැලසුම්ගත ප්‍රසම්පාදන වියදම ඉක්මවා සියයට 23 සිට සියයට 262 දක්වා වු පරාසයක වියදම් දරා තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන සැලසුම් සකස් කිරීම නිසි කළමණාකරිත්වයෙන් සිදුකර නොමැති බව නිරික්ෂණය විය. | ඉදිරියේදී මනා කළමනාකාරීත්වයකින් යුතුව සැලසුම් සකස් කොට සැලසුම් ප්‍රකාරව කටයුතු කරන බව. | සැලසුම් සකස් කිරිම නිසි කළමනාකාරීත්ව යකින් සිදු කළ යුතු බව. |

## 2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) වැය විෂයය අංක 1001 යටතේ ප්‍රතිපාදන ඉතිරිය ඉක්මවා රු.7109 ක බැඳීම් හා බැරකම් වලට එළඹ තිබුණි. | ඉදිරියේදී ප්‍රතිපාදන නොඉක්මවා බැරකම් වලට එළැඹීමට කටයුතු කරන බව දන්වමි. | ප්‍රතිපාදන ඉක්මවා බැරකම් නොදැරිය යුතු බව. |
| (ආ) වැය විෂයය අංක 1409 යටතේ ප්‍රතිපාදන ඉතිරිය රු.988,704 ක් වුවද 2021 අගෝස්තු 28 දිනැති රාජ්‍ය වියදම් සමාලෝචනය පිළිබඳ අමාත්‍ය මණ්ඩල සංදේශය පරිදි වියදම් අවුරා තැබූ පසු ප්‍රතිපාදන ඉතිරිය රු.162,703 කි. උක්ත වැය විෂයය යටතේ වර්ෂ අවසානයට වූ බැඳීම් වටිනාකම රු.177,589 ක් විය. ඒ අනුව රු.14,886 ක ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට එළඹ තිබුණි. | ඉදිරියේදී ප්‍රතිපාදන නොඉක්මවා බැරකම් වලට එළැඹීමට කටයුතු කරන බව දන්වමි. | ප්‍රතිපාදන ඉක්මවා බැරකම් නොදැරිය යුතු බව. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

මරද මඩු දෙවස්ථානයේ රාජකාරි කටයුතු සඳහා පැමිණෙන දෙපාර්තමේන්තු නිළධාරීන් හා අනෙකුත් රාජ්‍ය නිලධාරීන් සඳහා නවාතැන් පහසුකම් වෙනුවෙන් වන්දනා ගෘහයක් ඉදිකිරීමේ පළමු අදියරට අදාලව රු.2,128,305 ක මුදලක් මන්නාරම් දිස්ත්‍රික් ලේකම් මඟින් කොන්ත්‍රාත්කරුවෙකුට ගෙවා තිබූ අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) උක්ත සඳහන් ගොඩනැගිල්ලේ පළමු අදියරට අදාලව ඇස්තමේන්තුවක් ලබා දෙන ලෙස දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් 2016 ජුනි 28 දින සිදුකර තිබූ ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් මන්නාරම දිස්ත්‍රික් ලේකම් විසින් ඇස්තමේන්තු සහ මැණුම්පත්‍ර ඉදිරිපත් කිරීම මාස 05 ක කාල පමාවකින් පසු 2016 නොවැම්බර් 25 දින සිදු කර තිබුණි. | මෙම වන්දනා ගෘහය ඉදි කිරීමේ කටයුතු අවසන් කිරීම සඳහා මන්නාරම් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙතින් නොයෙක්වර ඇස්තමේන්තු ගෙන්වා ගැනීමට ලිඛිතව හා වාචිකව ඉල්ලීම් කලද ඒ සඳහා යහපත් ප්‍රතිචාරයක් නොලැබුණි. 2018 හා 2019වසර වල දී මෙම ඉදිකිරීම සම්පූර්ණ කර ගැනීමට දෙපාර්තමේන්තුව දරන ලද උත්සහායන් අසාර්ථක වීම මත මෙම සංවර්ධන කටයුත්ත අඩාලව පැවතිණ. | ව්‍යාපෘති වෙනුවෙන් වැය කරනු ලබන ප්‍රතිපාදන ඉලක්ක ගත අරමුණු ඉටුකර ගැනීම සඳහා නිසි කළමනාකරීත්වය කින් යුක්තව යෙදවිය යුතු බව. |
| (ආ) 2017 සැප්තැම්බර් 13 දිනෙන් ආරම්භ කර 2017 දෙසැම්බර් 11 දින අවසන් කළ යුතු කොන්ත්‍රාත්තුවේ පළමු අදියරේ ඉදිකිරීම් කටයුතු 2017 දෙසැම්බර් 23 දින අවසන් කර තිබූ අතර ඉදිරි ඉදිකිරීම් කටයුතු සඳහා ඇස්තමේන්තුවක් පිළියෙල කරන ලෙස 2017 සැප්තැම්බර් 14 දින දිස්ත්‍රික් ලේකම් විසින් දිස්ත්‍රික් ඉංජිනේරුවරයා වෙත දන්වා තිබුණි. ඒ සඳහා දිස්ත්‍රික් ඉංජිනේරුවරයා විසින් පිළිතුරු සපයා තිබුණේ 2019 අප්‍රේල් 05 වන අතර එදින තෙක් පසු විපරම් කටයුතු කිසිවක් සිදුකර නොතිබුණි. | අංක 55/2145හා 19/10/2019දින නිකුත් කරනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය මගින් මඩු සිද්ධස්ථානය පූජා භූමියක් බවට පත්කොට ඇත. ඒ අනුව මඩු සිද්ධස්ථානය පූජා භූමියක් බවට පත්වීමෙන් පසු මෙම දෙපාර්තමේන්තුවට එකී සිද්ධස්ථානයේ සංවර්ධන කටයුතු ස්වාධීනව සිදු කල නොහැකි බවත් එසේ සංවර්ධන කටයුතු සිදු කරන්නේ නම් මෙහෙයුම් කමිටුවක් පත්කර ගනිමින් එහි අධීක්ෂණය යටතේ ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව එකී සංවර්ධන කටයුතු සිදු කල යුතු බව 2021. 02.24 දින නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ පැවති සාකච්ඡාවේදී සඳහන් කෙරිණි.එහෙත් පසුගිය කාලවකවානුව තුල පැවති කොරෝනා වසංගත තත්වය හේතුවෙන් මෙකී සංවර්ධන ව්‍යාපෘතිය සඳහා මෙහෙයුම් කමිටු රැස්වීම් පවත්වාගත නොහැකි තත්වයක් මතුවිය.නමුත් ඉදිරියේදී මෙහෙයුම් කමිටු රැස්වීම් නොපැවැත්වුවද ජාතික භෞතික සැලැසුම් දෙපාර්තමේන්තුව හා | |
| (ඇ) ව්‍යාපෘතියේ පළමු අදියරේ කටයුතු වෙනුවෙන් 2017 දෙසැම්බර් 08 දින වන විට කොන්ත්‍රාත්කරුට රු.2,128,305 ක මුදලක් ගෙවා තිබුණද, දුර්වල තත්ත්ව පාලනය හේතුවෙන් වසරක වගකීම් කාලය ගතවීමටත් පෙර කණු පාදම් ඉරිතලා ඇති බැවින් ඉතිරිව ඇති ඉදිකිරීම් කටයුතු සඳහා ඇස්තමේන්තු | | |

පිළියෙල කළ නොහැකි බවත්, ඒ සඳහා ගොඩනැඟිලි දෙපාර්තමේන්තුවේ උපදේශකත්වය ලබා ගන්නා ලෙසත් දිස්ත්‍රික් ඉංජිනේරුවරයා විසින් දන්වා තිබුණි.

එක්ව 2023 වසරේ දී වාර්ෂික අයවැය ප්‍රතිපාදන තුලින් මෙම වන්දනා ගෘහයේ වැඩකටයුතු නිම කිරීමට ඉදිරි වසරවලදී අවශ්‍ය පියවරයන් කඩිනමින් ගන්නා බවද වැඩිදුරටත් දන්වනු කැමැත්තෙමි.

(ඇ) ගොඩනැඟිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරුවරයා විසින් ඉදිකිරීමේ කණු පාදම් **(Column Footing)** නිරීක්ෂණය කළ බවද මැණුම් පත්‍රයේ 225**mm** බැගින් දක්වා ඇති කණු පාදම්වල ඝනත්වය ඇතැම් පාදම් 100 **mm** ලෙසත් ඇතැම් පාදම්වල 60 **mm** ලෙසත් නිරීක්ෂණය වූ බවත් එම නිසා ගොඩනැඟිල්ලේ ශක්තිමත් බව නිර්ණය කළ නොහැකි බවත් දන්වා තිබූ අතර මඩු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තාක්ෂණික සහකාර නිලධාරි විසින් කණු පාදම් 255 **mm** ක ඝනත්වයට වඩා වැඩි ඝනත්වයකින් යුක්ත බව සහතික කර තිබුණි. ඒ අනුව ඉදිකිරීම් සම්බන්ධයෙන් පරස්පර නිර්දේශ ඉදිරිපත් කර තිබූ බව නිරීක්ෂණය විය.

(ඉ) කොන්ත්‍රාත් භාරගැනීමේ ලිපිය අනුව **(Letter of Acceptance)** රු.96,000 ක් වූ කාර්යසාධන ආරක්ෂණයද **(Performance Security)** 2018 ජනවාරි 08 දිනෙන් අවසන් වී තිබුණි. ව්‍යාපෘතියේ ව්‍යාපෘති අඩුපාඩු පැවතියද, මන්නාරම දිස්ත්‍රික් ලේකම්, මඩු ප්‍රාදේශීය ලේකම් හෝ ක්‍රිස්තියානි කටයුතු දෙපාර්තමේන්තුව විසින් නිසි අධීක්ෂණය සහ පසු විපරම් කටයුතු සිදු කර නොතිබුණු අතර 2019 ජනවාරි 30 දින

රු.106,415 ක් වූ රඳවුම් මුදලද නිදහස් කර තිබුණි.

(ඊ) රු.මිලියන 2.5 ක වියදමක් දරමින් සිදු කරන ලද ගොඩනැඟිල්ල ඉදිකිරීමේ මූලික කටයුතු 2017 දෙසැම්බර් 23 දින අවසන් කර තිබුණද ඉදිකරන ලද කොටසේ පවතින දුර්වලතා සහ නිලධාරීන් අතර සම්බන්ධීකරණයක් නොපැවතීම හේතුවෙන් ස්ථානීය පරීක්ෂණය සිදු කළ 2022 පෙබරවාරි 18 දින වන විටත් ගොඩනැඟිල්ලේ ඊළඟ අදියරේ ඉදිකිරීම් කටයුතු ඇණහිට තිබුණි. ඒ අනුව ඉහත රු.මිලියන 2.5 ක වියදම නිෂ්කාර්ය වියදමක් බව නිරීක්ෂණය කෙරේ.

### 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ අනුමත රියැදුරු තනතුරු 02 න් එක් තනතුරක් පුරප්පාඩු වී පැවතීම හේතුවෙන් දෙපාර්තමේන්තුව සතුව පවතින වාහන දෙකෙන් එකක් 2020 ජනවාරි 28 දින සිට නිශ්කාර්යව පැවතුණි. | මෙම රියදුරු පුරප්පාඩුව සම්බන්ධයෙන් රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ PACIS මෘදුකාංග වැඩසටහනෙහි මෙන්ම කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 2017/04 :අනුව සෑම කාර්තුවකම යොමු කරන කාර්ය මණ්ඩල වාර්තාවෙහි යාවත් කාලීන කරනු ලැබේ. පුරප්පාඩු පිරවීම දෙපාර්තමේන්තු වපසරියෙන් බැහැරව ක්‍රියාවලියක් වන බැවින් මෙකී පුරප්පාඩු කඩිනමින් පුරවා ගැනීමට කටයුතු සිදු කරනු ලබයි. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු බව. |

## 3.3 පාඩු හා හානි

-----------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 සැප්තැම්බර් 12 දින අනතුරට ලක්වූ අංක **NB 2558** දරන වාහනයට සිදුවූ රු.137,707 ක අලාභය මෙතෙක් අයකර ගෙන නොතිබුණු අතර කපා හැරීමට ද කටයුතු කර නොතිබුණි. | අනතුරට දාල අනෙක් පාර්ශවයෙන් එම මුදල අයකර ගැනීම සඳහා නීතිමය උපදෙස් ලබා ගැනීමට කටයුතු කර ඇත. | වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට හෝ කපා හැරීමට කටයුතු කළ යුතු බව. |

## 4. යහපාලනය

-------------------

## 4.1 අභ්‍යන්තර විගණනය

-------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තියේ විධිවිධානවලට අනුකූලව අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම පිණිස සුදුසු විගණකවරයෙකු පත්කරනු ලැබිය යුතු වුවත් දෙපාර්තමේන්තුවේ විගණන කටයුතු සඳහා කළමනාකරණ සේවා නිලධාරියෙකු පත් කර තිබුණි. | මෙම දෙපාර්තමේන්තුවට අයත් අනුමත කාර්ය මණ්ඩලයෙහි අභ්‍යන්තර විගණක යන තනතුරක් නොමැති බවත් අනුමත කාර්ය මණ්ඩලයෙහි පවතින ගණකාධිකාරී තනතුර සඳහා ස්ථිර පත්වීමක් නොමැතිව වසර 10ක පමණ කාලයක් පුරප්පාඩුව පවතින බවත් දන්වා සිටිමි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුවේ අනුමත මුළු තනතුරු සංඛ්‍යාව 61 ක් වු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සහකාර අධ්‍යක්ෂ, ගණකාධිකාරි, සංවර්ධන නිලධාරි, රියැදුරු සහ කාර්යාල කාර්ය සහයක තනතුරු 01 බැගින් තනතුරු 05 කට සහ කළමනාකරණ සේවා නිලධාරී තනතුරු 03 කට අදාලව පුරප්පාඩු 08 ක් පැවතිණි. | මෙම පුරප්පාඩු සම්බන්ධයෙන් දැනුවත් කිරීමට රාජ්‍ය සේවා ,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ PACIS මෘදුකාංගයේ නිරන්තරයෙන් යාවත්කාලීන කරනු ලබන අතර කාර්තුමය වශයෙන් වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතද යවනු ලබයි. මෙම පුරප්පාඩු පිරවීම දෙපාර්තමේන්තු වපසරියෙන් බැහැර ක්‍රියාවලියක් වන බැවින් මෙකී පුරප්පාඩුව කඩිනමින් පුරවා ගැනීමට කටයුතු සිදු කරනු ලබයි. | තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කල යුතු බව. |